# ලෙබනනය සිවිල් යුද්ධයක් අභිමුව

## Lebanon on brink of civil war

**ක්‍රිස් මාස්ඩන් විසිනි**
**2008 මැයි 9**

ලෙබනනය පූර්න සිවිල් යුද්ධයක් අභිමුඛයේ සිටී. ඉහල යන බඩුමිලට එරෙහිව සහ අඩුම වැටුප් තලය වැඩිකරන ලෙස ඉල්ලමින් ප්‍රමුඛ පෙලේ වෘත්තීය සමිති විසින් දියත් කල වැඩ වර්ජනය, බටහිර ගැති සුන්නි හා අගමැති ෆුවාර්ඩ් සිනියෝරාගේ දෘෂ්-පාදක කරගත් ආන්ඩුව සමග ෂියා පාදක කර ගත් හෙස්බුල්ලාහ් හා එහි සගයකු වන අමාල් අතර සන්නද්ධ ගැටුමක් දක්වා ගමන් කොට ඇත.

පසුගිය දින දෙක තුලදී, ගැටුම නිරන්තරයෙන් උත්සන්න කෙරෙමින් පවතී. බදාදා දිනයේදී, හෙස්බුල්ලාහ් නායකත්වය දෙන විපක්ෂයේ ආධාරකරුවෝ බීරූට් අගනුවර මාර්ග අවහිර කලහ. රජයට පක්ෂපාතී සහ එරෙහි තරුන කන්ඩායම් විසින් ගල් දමා ගැසීමෙන් මිනිසුන් දූසිමක් පමන තුවාල වී ඇත.

බ්‍රහස්පතින්දා දිනයේදී, හෙස්බුල්ලාහ් සංවිධානයේ බලවත් ප්‍රදේශයක් වන බාල්බෙක්, මධ්‍ය ලෙබනනය හා බේරූට් සමග යා කරන හතරමං සන්ධිය වන නැගෙනහිර බෙකා වැලි හි ඇති සාඩ්නයෙල් ගමෙහිදී සුන්නිවරු සහ ෂියාවරු වෙඩි හුවමාරු කර ගත්හ.

හෙස්බුල්ලාහ් ආධාරකරුවෝ රටෙහි එකම ගුවන්තොටුපලට යන මාර්ගය අවහිර කරමින් එය වසා දැමූහ. අග නගරය අක්‍රීය කරමින් පිලිස්සෙන ටයර් සහ පස් ආවරන ගොඩ නැගූහ.

බටහිර බේරූට්හි අල් මස්රා දිස්ත්‍රික්කයේ සුන්නි සහ ෂියා සටන්කරුවන් අතර බරපතල සටන් ඇවිලී ගියේය. විරුද්ධවාදී තුවක්කුකරුවෝ රාජ්‍ය ගැති ෆියුචර් ව්‍යාපාරයට අයිති කාර්යාලයක් විනාශ කිරීමට රොකට් විදින ග්‍රෙනේඩ් යොදාගත්හ. එහි තිබූ ආයුධ සහ උන්ඩ අත්පත් කර ගන්නා ලදී.

ෂියාවරුන්ගේ බලය පවතින දකුනේ අගනගරවලින් බේරූට් වෙන් කරමින්, ප්‍රධාන පොදු පාරවල සහ හතරමං හන්දිවල හමුදාව යොදවනු ලැබීය. සුන්නි-ෂියා මිශ්‍රිත මස්රා දිස්ත්‍රික්කයෙහි කැරලි මර්ධන හමුදාවන් ගල් දමාගසන සතුරු තරුන කන්ඩායම් අතරට යෙදවිනි.

"මෙම තත්වය දිගටම පැවතීම මිලිටරි කාර්ය මන්ඩලයේ එක්සත්භාවයට හානිකරබව" ලෙබනන් හමුදා ප්‍රධානී අනතුරු ඇගවීය.

එ.ජ. හා සවුදි සහාය ලබන රජය සහ ඉරාන හා සිරියාවේ සහාය ලබන හිස්බුල්ලාහ් අතර මාස 17 ක අර්බුදය ගැටුමට මුල් විය. ලෙබනනයේ ජනාධිපතිවරනය 18 වතාවක් කල් දමන්නට සිදුවිනි. අරාබි ලීගයේ මහ ලේකම් අම්ර් මූසා හට මේ මස සම්මුතියක් ඇති කර ගැනීමට නොහැකි වීමත් සමග නව ජනාධිපතිවරයෙක් පත් කරගැනීමේ ඊලග ප්‍රයත්නය සඳහා දිනය මැයි 13 ලෙස පාර්ලිමේන්තු කතානායක නබී බෙරි නම් කලේය.

පාලක මාර්තු 14 කන්ඩායම, හිස්බුල්ලාහ් ආක්‍රමනයේ ගොදුරක් ලෙස පෙනුනේ වුවත්, සත්‍ය වශයෙන් ගත් කල එය, හිස්බුල්ලාහ් නායකත්වය දෙන මයිකල් අයොන්ගේ ක්‍රිස්තියානි නිදහස් දේශප්‍රේමී ව්‍යාපාරයද ඇතුලත් මාර්තු 8 සංධානය සමග විවෘත ගැටුමක් දෙසට මාස ගනනාවක් තිස්සේ වැඩ කරමින් සිටියේය. හිස්බුල්ලාහ්ට එරෙහිව සටන් නැවත ආරම්භ කිරීමේ තම අභිලාෂය පැහැදිලිව දක්වා ඇති සහ සිරියාවට හා ඉරානයට තර්ජනය කර ඇති එක්සත් ජනපදය සහ ඊස්රායලය යන දෙගොල්ලන්ම සමග සහයෝගයෙන් ඔවුන් මෙසේ කර ඇත.

ලෙබනනය, බොහෝ කාලයක් පුරා, එ.ජ. හා එහි මිතුරු පාර්ශවයන් වන ඊස්රායලය, සවුදි අරාබිය හා ප්‍රංශයද අනෙක් පසින් සිරියාව හා ඉරානයද එහි දේශීය මිතුරන් වන හිස්බුල්ලාහ් හා අමාල්ද අතර, කලාපීය තරගයක නාභීය ලක්ෂ්‍යය වී ඇත. තමන්ගේ යටත් රාජ්‍යයක් ලෙසත් ඊස්රායලයේ තම ප්‍රධාන බල පදනමෙහි විස්තාරනයක් ලෙසත් ලෙබනනය ක්‍රියා කිරීම තම අවශ්‍යතාවය නිසා, වොෂින්ටනය දිගින් දිගටම හිස්බුල්ලාහ් සමග කිසිඳු සම්මුතියකට එලඹීම වලක්වනු ලැබීය. තෙල් සම්පත් බහුල කලාපය තුල එ.ජ. ආධිපත්‍යය ස්ථාපිතකිරීමට සිරියාවේ සහ ඉරානයේ වියහැකි ආන්ඩු වෙනසකට මෙය පූර්වනිමිත්තක් විය හැක.

2000 දී, ඊස්රායල හමුදා ලෙබනනයෙන් ඉවත් කර ගැනිනි. නමුත් හිස්බුල්ලාහ් ඉලක්ක කරමින් 2006 ජූලි වලදී ලෙබනනයට එරෙහිව යුධ ප්‍රකාශ කරමින් ඊස්රායලය ලෙබනනය තුල තම නිරන්තර සැලසුම් පැහැදිලිව දැක්වූවේය. මේ කාලය තුල මිනිසුන් 1200

කට වඩා මරාදැමුනු අතර, තව බොහෝ දෙනා තුවාල ලදහ. රටෙහි යටිතලපහසුකම් විශාල පදාසයක් විනාශ කෙරිනි.

හිස්බුල්ලාහ් පරාජය කිරීමට ඊස්රායලයේ නොහැකියාව ජෙරුසෙලම්හි ප්‍රධාන දේශපාලන අර්බුදයක් ඇති කල අතර, ෂියා පොදු ජනයා අතරේ හිස්බුල්ලාහ් තව දුරටත් ජනප්‍රියත්වය දිනා ගත්තේය.

එම කාලයේ සිට, ඊස්රායලය සහ සිරියාව අතරේ අස්ථිර සාම කතා වලකාලමින්, ඩැමස්කස් සහ ටෙහෙරාන් යන දෙතැනටම එරෙහිව යලි යලිත් කුපිතකිරීම් නංවමින් හිස්බුල්ලාහ්, සිරියාව සහ අවසානයේ ඉරානය සමග ගැටුමක් සඳහා නිමිත්තක් නිර්මානය කිරීමට එ.ජ. උත්සුක වූයේය. පසුගිය සැප්තැම්බරයේදී, නිර්නාමික එ.ජ. මූලාශ්‍රයක් විසින් බාගෙට නිමකල න්‍යෂ්ඨික ප්‍රතික්‍රියාකාරකයක් සොයා ගනු ලැබුවේ යැයි ප්‍රකාශ කරමින් ඊස්රායල් යුධ ගුවන් යානා සිරියාවට බෝම්බ හෙලීය.

පෙබරවාරි 28 දා එ.ජ. කෝල් නෞකාව ලෙබනන් වෙරල සමීපයේ රැඳී සිටියදී, නාවික භටයන් 2000 ක් සමගින් දියගොඩ දෙකෙහිම ගොඩබෑසිය හැකි යාත්‍රා සමග නෞකා හයකින් සමන්විත නසාවූ යුද්ධ කන්ඩායම ඔවුනට එක්විය. "කලාපීය ස්ථාවරත්වය සඳහා සහයෝගය ඇති බව පෙන්වීම වැදගත් බව එක්සත් ජනපදය විශ්වාස කරයි. අපි ලෙබනනයේ තත්වය සම්බන්ධව වඩා සැලකිලිමත් වෙමු. එය බොහෝ කාලයක් ඇදෙමින් පවතී." එ.ජ. උසස් නිලධාරියෙක් එම අවස්ථාවේ ප්‍රකාශ කලේය.

එම මාසය තුලම, ඉරාකයේ ඇමරිකානු ආක්‍රමනයට එරෙහි සටන්කරුවන්ට සහයෝගය දීමේ භූමිකාවක් නිරූපනය කරන්නේ යැයි නම් නොකල පුද්ගලයන් හට චෝදනා එල්ලකරමින් බුෂ් පරිපාලනය සිරියාවට එරෙහිව තවත් වටයක සම්බාධක පනවන බව නිවේදනය කලේය.

ගිය වසරේ ඊස්රායල් ගුවන් හමුදා විසින් ඉලක්ක කල ස්ථානයේ, උතුරු කොරියා ආධාර මත, ඩැමස්කසය න්‍යෂ්ටික ප්‍රතික්‍රියාකාරකයක් ඉදිකරමින් සිටි බව ඔප්පු කරන්නට බුෂ් පරිපාලනය අප්‍රියෙල් 24දා රහස්‍ය වාර්තාවක් මුදා හැරියේය. ධවල මන්දිර ප්‍රකාශනයක් අනතුරු ඇඟවූයේ සිරියාවේ චෝදනා ලද අබිරහස් ප්‍රතික්‍රියාකාරකය ඉදිකිරීම "කලාපයට හා ලෝකයට අනතුරුදායකවූත් සංවර්ධනය අස්ථාවර කරන්නා වූත් සාධකයක් බවය

ඊස්රායලය මුලින් කල බෝම්බ හෙලීම් පිලිබඳ එ.ජ. සාධාරනීකරනය එවන් ක්‍රියාමාර්ග වල යෙදීම සඳහා ඉඩ කඩ සලසයි. මෙවන් චෝදනා, ඉරානය න්‍යෂ්ටික අවි වැඩසටහනක් වර්ධනය කරන බවට දිගින් දිගටම දෝෂාරෝපනය කිරීම්, සමගත් පෑහී යයි.

2007 සැප්තැම්බර්හි තම ගුවන් ප්‍රහාර වලට පසුව පලිගැනීම් ඇවිස්සීමේත් ලෙබනනයේ තවත් ඊස්රායල යුද්ධයක් සඳහා නිමිත්තක් සැපයීමේත් අරමුන සහිතව කල ක්‍රියාමාර්ගයක් වශයෙන්, ඊස්රායලය, මේ වසරේ පෙබරවාරියේ 12 දා ඩැමස්කස්හිදී හිස්බුල්ලාහ් ජ්‍යෙෂ්ඨ නායකයෙක් වන ඉමාඩ් මුග්නියා ඝාතනය කලේය.

ලෙබනනයේ උත්සන්න වන ගැටුම්කාරී තත්වය මධ්‍යයේ, සිරියාව රහසේ න්‍යෂ්ටික ප්‍රතික්‍රියාකාරකයක් ගොඩනගන්නට උත්සාහ කරන්නේ යැයි චෝදනාව පාවිච්චි කරමින් මැයි 8 වනදා ජනාධිපති ජෝජ් බුෂ් සිරියාවට එරෙහිව පනවා ඇති සම්බාධක තවත් වසරකින් දීර්ඝ කලේය. එම සම්බාධක වලට සිරියානු වත්කම් අත්හිටවීමත් ආනයනික භාන්ඩ කීපයක් තහනම් කිරීමත් ඇතුලත් විය. ඩැමස්කසය ත්‍රස්තවාදයට උදව් කරන බවටද, ලෙබනනය හා ඉරාකය තුල තම මැදිහත්වීම පවත්වාගෙනයන බවටද, ජන ඝාතක ආයුධ හා මිසයිල් වැඩසටහන් අත්පත්කරගැනීමට උත්සාහගන්නා බවටද, බුෂ් චෝදනා කලේය.

හිස්බුල්ලාහ්ට එරෙහිව සිනියෝරා රජයේ මෙම කුපිතකිරීම් නිරීක්ෂනය කල හැකි වන්නේ එ.ජ.- ඊස්රායල මූලිකත්වයෙන් කෙරෙන මෙම ආක්‍රමන වල ව්‍යාප්තියක් හැටියටය. රූපවාහිනියෙන් විකාශනය කෙරුනු පෙබරවාරි 10 කතාවේදී, දෲස් නායක වාලිඩ් ජම්බ්ලට් හිස්බුල්ලාහ් හට මෙසේ තර්ජනය කලේය. " ඔබට කලබලයක් අවශ්‍යද? එය සාදරයෙන් පිලිගැනේවි. ඔබට යුද්ධයක් අවශ්‍යද? එය සාදරයෙන් පිලිගැනේවි. අප හට අවි ආයුධ වලින් ප්‍රශ්නයක් නැත, මිසයිල් වලින් ප්‍රශ්නයක් නැත. අපි ඔබ වෙත ඒවා ගෙන එන්නෙමු."

ගිය සතියේදී එම දිශාවට ක්‍රියාවන් දෙකක් සිදුකරන ලදී.

සති අන්තයේදී, විය හැකි ප්‍රහාරයක් හෝ පැහැරගෙනයෑමක් සඳහා සූදානම්වීමක් ලෙස හිස්බුල්ලාවරු ආරක්ෂක කැමරා උපයෝගී කොටගෙන බීරූට් ජාත්‍යාන්තර ගුවන්තොටුපල නිරීක්ෂනය කරමින් සිටින බව ජම්බ්ලට් දෝෂාරෝපනය කලේය. හිස්බුල්ලාවරු සමග සානුකම්පිතව ක්‍රියා කිරීම පිලිබඳව චෝදනා කරමින්ද, ප්‍රධාන ධාවන පතය නිරීක්ෂනය කරන්නට අටවා ඇතැයි චෝදනා කෙරෙන රහස්‍ය කැමරා ගැන ක්‍රියාත්මක වන්නට අසමත් වීම නිසාද, ගුවන් තොටුපලෙහි ආරක්ෂක අනදෙන නිලධාරියා වන බ්‍රිගේඩියර් වාෆික් ෂුකියර් හට, නැවතත් හමුදා අනදෙන නිලධාරි තනතුරට මාරුවන ලෙස රජය අගහරුවාදාදින නියෝග කලේය.

ෂුකියර් පාර්ලිමේන්තු කතානායක සහ හිස්බුල්ලාහ්ගේ සන්ධාන සහකරු වන අමාල්හි නායකයා වන නබී බෙරීගේ සමීපතමයෙකි. ගුවන් තොටුපලට පිවිසෙන මාර්ග අවහිර කරන්නට පොලඹවන ලද්දේ මෙම ක්‍රියාවයි.

එම කතාවේදීම, ලෙබනනයේ සිදුවන දුරකතන සාකච්ඡාවලට රහසේ සවන් දෙන්නට තමාගේම පුද්ගලික දුරකතන ජාලයක් ගොඩ නගා ගැනීම සම්බන්ධයෙන්ද ජම්බ්ලට් හිස්බුල්ලාට චෝදනා

කලේය. ඒ සමගම, හිස්බුල්ලාගේ දුරකතන ජාලය " නීති විරෝධී හා ව්‍යවස්ථා විරෝධී" සහ ජාතික ආරක්ෂාවට තර්ජනයක් බව අධිකරනයට මේ සම්බන්ධව ලිපි ගොනුවක් යොමු කරමින් රජය අගහරුවාදා ප්‍රකාශයක් කලේය.

දුරකතන ජාලය ඉලක්කකිරීම තියුනු ප්‍රතිචාරයක් තහනම් කිරීම සමග බැඳී පවතී. හිස්බුල්ලාවරු ඇත්තටම පුලුල් නිත්‍ය-සේවා විදුලි සංදේශ ජාලයක් පවත්වාගෙන යති.

ටයිම්-සී.එන්.එන්. පුවත් වලට අනුව, "බීරුට්හි දකුනු තදාසන්නයේ පිහිටි තම මූලස්ථානයත්, දකුනුදිග ඊස්රායල දේශ සීමාව දක්වා තම කාර්යාලත්, තම හමුදා මුරපලවල්, සහ කාඩර්වරුනුත් සම්බන්ධ කරමින් හිස්බුල්ලාවරු දැනට ටික කලකට පෙරාතුව ගෘහස්ත තමන්ටම වෙන්වූ දෘෂ්‍ය තන්තු දුරකතන ජාලයක් සවි කලෝය. 2006 සරත් සමයේ යුද්ධයේදී, ඊස්රායලය ලෙබනනය පුරාවටම ජංගම දුරකතන අවහිර කලත්, ලෙබනන දුරකතන මාර්ග නිරීක්ෂනය කලත්, තම පුද්ගලික දෘෂ්‍ය තන්තු ජාලයට පින්සිදු වන්නට හිස්බුල්ලාගේ අභ්‍යන්තර සන්නිවේදන මාර්ග අනතුරු රහිතව පැවතුනි."

"කෙසේවුවද, යුධයෙන් පසු කාලයේ, එක්සත් ජාතීන් මුර සංචාරයේ යෙදෙන දකුනේ දේශ සීමා දිස්ත්‍රික්කයේ උතුරින් පිහිටි නව මිලිටරි ඉදිරිපෙලත්, නැගෙනහිර බෙකා මිටියාවතත්, ආවරනය කරමින් හිස්බුල්ලා එම ජාලය ව්‍යාප්ත කලේය. අන්තර් ජාලයට සහ ජංගම දුරකතන වලට රැහැන් රහිත පුලුල් පිවිසුමකට ඉඩ සලසමින් පද්ධතියේ කොටසකට වයිමැක්ස් (WIMAX) ජාලයක් අන්තර්ගත කලේය."

"ලෙබනන විදුලි සංදේශ අමාත්‍ය මර්වාන් හමාඩ්ට අනුව මෑත කාලයේදී දෘෂ්‍ය තන්තු කේබල් සඳහා ප්‍රධාන වශයෙන් ක්‍රිස්තියානි හා ද්‍රෑෂ් මවුන්ට් ලෙබනන් දිස්ත්‍රික්කයේ සහ උතුරු ලෙබනන්හි හිස්බුල්ලාවරු අගල් හැරූහ."

මෙම ජාලයට කෙරෙන ප්‍රහාරයකින්, ඊස්රායල ආක්‍රමනයකින් හෝ තම අභ්‍යන්තර විරුද්ධවාදීන්ගෙන් එල්ලවෙන ප්‍රහාරයකින් ආරක්ෂාවීමට, හිස්බුල්ලාහ්ගේ හැකියාව දරුනු ලෙස කප්පාදු කරනු ඇත. කුපිතකිරීම අපේක්ෂිත අරමුන ඉටුකරගෙන ඇත. බ්‍රහස්පතින්දා, 2006න් පසුව පැවති තම පලමු ප්‍රවෘත්ති සාකච්ඡාවේදී, හිස්බුල්ලා නායක ෂේක් හසන් නස්රල්ලා තම ව්‍යාපාරයේ පුද්ගලික දුරකතන ජාලය වසාදැමීමට ගන්නා තීරනය "යුද්ධ ප්‍රකාශකිරීමක්" බව කියා සිටියේය.

තම ජාලය විදේශීය ආක්‍රමනකාරීන්ට එරෙහිව ඇති වඩාත්ම වැදගත් අවිය බව විස්තර කරමින්, "මෙම තීරනය, ඇමරිකාවේ සහ ඊස්රායලයේ ශුභසිද්ධිය සඳහා, පලමු කොටම යුද්ධ ප්‍රකාශකිරීමක් සහ ප්‍රතිරෝධය දක්වන සංවිධාන හා එහි ආයුධවලට එරෙහිව රජය විසින් දියත් කරන යුද්ධයකැයි ඔහු කියා සිටියේය. අපට එරෙහිව යුද්ධ ප්‍රකාශකරන හෝ යුද්ධයක් දියත්කරන කවරෙකු හෝ වේවා, ඔහු අපේ පියා හෝ සහෝදරයා, හෝ හුදු දේශපාලන විරුද්ධවාදිවාදියෙක් වුවත්, අප ආරක්ෂාවීමටත්, අපේ ආයුධ ආරක්ෂාකිරීමටත්, අපේ ප්‍රතිරෝධය ආරක්ෂාකිරීමටත්, සහ අපේ පැවැත්ම ආරක්ෂාකිරීමටත්, අපට අයිතියක් ඇතැ"යි ඔහු පැවසීය.

තම තීරනය අවලංගු කරන ලෙසත් බ්‍රිගේඩියර් ජෙනරාල් වාෆික් ෂුකියර් නැවත සේවයෙහි පිහිටුවන ලෙසත් ඔහු රජයෙන් ඉල්ලා සිටියේය.

"තම කඩා කප්පල්කාරී ක්‍රියාකාරකම් නතරකර දමන" ලෙසද "ත්‍රස්තවාදී කන්ඩායමක් වනවාද නැතහොත් දේශපාලන පක්ෂයක් වනවාද" යන්න තෝරාගතයුතු යැයිද එ.ජ. ජාතික ආරක්ෂක කවුන්සිලයේ ප්‍රකාශක ගෝර්ඩන් ජෝන්ඩ්‍රෝ ඊයේ හිස්බුල්ලාගෙන් ඉල්ලා සිටියේය.

ඊස්රායලයේ 60 වන සංවත්සර උත්සවයට හා සවුදි අරාබිය සමග එ.ජ. සම්බන්ධතා වලට 75 වසරක් ගතවීම නිමිත්තෙන් පැවැත්වෙන උත්සවයට එහි යාමෙන් අනතුරුව, ඊලග සතිය අග ඊජිප්තුවේ ෂාම් අල් ෂේක්හි රතු මුහුදු නිකේතනයේදී, සිනියෝරා හමුවීමට බුෂ් සැලසුම් කර ඇත. වර්තමාන ගැටුම නිර්මානය කිරීම පිලිබඳව නිර්නාමික "විදේශීය අන්තගාමී පාර්ශ්වයන්ට" සවුදි අරාබිය තම පැත්තෙන් චෝදනා කලේය.

© www.wsws.org